**සීමිත නැට් වෙල්ත් සෙකියුරිටීස් සමාගමේ 2021**
**--------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සීමිත නැට් වෙල්ත් සෙකියුරිටීස් ("සමාගම") හි 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල බලපෑම් හැර සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

කරුණක් අවධාරණය කිරීම.

මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 1.2 වෙත අවධානය යොමු කරවමි.ඉහත සටහනේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා රජය මෙහෙයවනු ලබන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (MHESTF) විසින් සමාගමේ කටයුතු මෙහෙයවීම හා පාලනය සිදු කරනු ලැබේ. 2018 අගෝස්තු 28 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සීමිත නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම ඇවර කිරීම සහ සීමිත නැට් වෙල්ත් සෙකියුරිටීස් සමාගම වෙනත් ආයෝජකයකු වෙත විකිණීම,මහ බැංකුවේ අනුමැතියට යටත්ව සිදු කල යුතු බව තීරණය කර තිබුණි.

කෙසේ වුවද, නැට්වෙල්ත් සෙකියුරිටීස් ලිමිටඩ් හි කොටස් ප්‍රාග්ධනය සියයට 49ක් පමණක් විකිණීමට සහ නැට්වෙල්ත් සෙකියුරිටීස් ලිමිටඩ් හි ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය අවසන් වන තුරු සීමාසහිත නැෂනල් වෙල්ත් කෝපරේෂන් ඇවර කිරීම අත්හිටුවීමට ඉහත කැබිනට් තීරණය සංශෝධනය කිරීමට 2020 පෙබරවාරි 26 දිනැති නව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද, 2020 ඔක්තෝබර් 26 වන දින නැෂනල් වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ් සහ නැට්වෙල්ත් සෙකියුරිටීස් ලිමිටඩ් යන සමාගම් දෙකම ඇවර කිරීමට තවත් කැබිනට් තීරණයක් ගෙන තිබුණි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය (ශ්‍රී.ලං.ම.බැ.) විසින් 2020 මැයි 31 දින පටන් මාස හයක කාලයක් සඳහා ප්‍රාථමික ගණුදෙනුකරුවන් ලෙස ව්‍යාපාර ක්‍රියාකාරකම් කරගෙන යාමට සමාගමට ඇති අවසරය අත්හිටුවා තිබුණි. පසුව එම සමාගම් දෙකම ඇවර කිරීමට 2020 ඔක්තෝබර් 26 දින ගෙන තිබූ කැබිනට් තීරණය අනුව 2020 දෙසැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රාථමික ගනුදෙනු අවසර බලපත්‍රය ඉවත් කර ගැනීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ගත් තීරණය සලකා බැලීමෙන් පසු 2020 දෙසැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රාථමික ගනුදෙනුකරුවකු ලෙස කටයුතු කිරීම සඳහා නැට්වෙල්ත් සෙකියුරිටීස් සමාගම වෙත ලබා දී ඇති පත්වීම ඉවත් කර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය තීරණය කර තිබුණි. මෙම කරුණු සම්බන්ධයෙන්, මාගේ වාර්තාවේ වෙනසක් ඇති කර නොමැත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව සමාගම කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව සමාගම ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම පිළිබඳ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් සහ දෝෂ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (LKAS 08) අංක 42 ඡේදයට පටහැනිව සමාගම විසින් 2009/2010, 2010/2011, 2011/2012, 2013/2014, 2014/2015 සහ 2015/2016 වර්ෂවලට අදාළව රු.304,536,754 ක ආදායම් බදු වගකීමක් සහ සමාලෝචිත | ආදායම් බදු පනතේ විධිවිධාන අනුව සීමිත නැට් වෙල්ත් සෙකියුරිටීස් සමාගමේ බදු වාර්තා ගොනු කළ පරිදි ප්‍රාථමික ගනුදෙනුකරු (PD) ද්විතීයික වෙළෙඳපොළ ගනුදෙනු මත ආදායම් බද්දට බැඳී නොමැති නමුත් ආදායම් බදු දෙපාර්තමේන්තුව එය පිළි නොගත් අතර 2014 වර්ෂයේ සිට එක් එක් වර්ෂය සඳහා තක්සේරු වාර්තා නිකුත් කිරීම අඛණ්ඩව | ප්‍රමිතය අනුගමනය කළ යුතුය. |

| | |
|---|---|
| වර්ෂය තුළ 2013, 2014 සහ 2017/2018 ට අදාළ රු.100,895,298 ක එකතු කළ අගය මත බදු වගකීමක් ගිණුම්ගත කර තිබුණි. | සිදු කරනු ලැබේ. සමාගම ඉහත පදනම මත බදු වාර්තා ඉදිරිපත් කළ අතර බදු වගකීම් සීමිත නැට් වෙල්ත් සෙකියුරිටීස් සමාගමෙන් (NWSL) ලැබිය යුතු ලෙස ගණනය කරන ලදී.<br>අවසාන කාර්යය ලෙස බදු අභියාචනා කොමිෂන් සභාවෙහි අභියාචනයක් ඉදිරිපත් කරන ලද අතර නඩු වර්ෂ 4 සිට 5 දක්වා අඛණ්ඩව පැවතුනි. එබැවින් මෙම ලැබිය යුතු වර්ෂ 4 සිට 5 දක්වා සියලු ලැබිය යුතු දෑ ලැබිය යුතු මුදල් ලෙස මුල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයට අදාළ රු. 5,573,700ක් වටිනා නීති සහ අනෙකුත් වෘත්තීය ගාස්තු සමාලෝචිත වර්ෂය සඳහා පරිපාලන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | එකඟ වේ. | පසුගිය වර්ෂය සඳහා දරන ලද වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත නොකළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි ලබා දී නොමැති

| අයිතමය | වටිනාකම රු. | සාක්ෂි ලබා දී නොමැති | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| Repo ආයෝජන | 94,304 | තැන්පතු සහතික | මෙය හඳුනා නොගත් ශේෂයක් වනු ඇත. සමාගම ඈවර කිරීම සඳහා තීරණය කර ඇති බැවින් ගිණුම්වලින් කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරනු ඇත. | ශේෂය තහවුරු කිරීම සඳහා ලේඛන පවත්වා ගත යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු දෑ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 03 ක කාලයක සිට ලැබිය යුතු වත්කම් මත අත්තිකාරම් ගෙවීම් රු. 515,100 ක් සහ වර්ෂ 05ක කාලයක සිට ලැබිය යුතු බදු මුදල රු.62,035,884 ක් අය කරගෙන නොතිබුණි. | අත්තිකාරම් ගෙවීම 2022 වර්ෂයේදී ගිණුම්වලට ගනු ලබන අතර වෙනස්කම් 2022 වර්ෂයේදී ලාභාලාභ ගිණුමට ගලපනු ලැබේ.<br>මුළු ගෙවිය යුතු වගකීම් නිරවුල් කරන ලදි. ඉන්පසු ලැබිය යුතු මුළු බදු මුදල දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 50% දඩ නිදහස් කිරීමක් ලෙස ලියා හැරීමට නියමිතය. | ශේෂය අයකර ගැනීමට ප්‍රමාදයකින් තොරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 17,945,416 ක අලාභයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු. 51,121,270 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.69,066,686 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ශුද්ධ ආයෝජන ආදායම රු.58,665,927 කින් අඩුවීම සහ පරිපාලන පිරිවැය රු.18,596,905 කින් අඩුවීමට එරෙහිව මූල්‍ය පිරිවැය රු. 40,847,253 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම විසින් සිදු කරන ලද ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනුව පැහැර හැරීම හේතුවෙන් 2015 වර්ෂයේදී සීමිත නැට් වෙල්ත් සෙකියුරිටීස් සමාගමට එරෙහිව ට්‍රිලියන් සෙකියුරිටීස් ප්‍රයිවට් ලිමිටඩ් විසින් වාණිජ මහාධිකරණයේ නඩු පවරා තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට ට්‍රිලියන් සෙකියුරිටීස් ප්‍රයිවට් ලිමිටඩ් වෙත සත්‍ය වගකීම රු. 54,152,747 ක් වූ අතර ලබා දුන් තීන්දුව අනුව, සමාගම රු. 95,000,000 ක් ගෙවා තිබූ අතර 2021 ජුනි 29 වන දින ට්‍රිලියන සෙකියුරිටීස් ප්‍රයිවට් ලිමිටඩ් සමාගමට එරෙහිව මුළු වගකීම පියවා ඇත. | එකඟ වේ. | සමාගමට සිදුවන පාඩු වළක්වා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නියමිත කාලයේදී ගත යුතුය. |
| (ආ) | වර්වුවල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ට්‍රේඩිං ලංකා ප්‍රයිවට් ලිමිටඩ් සමාගමට එරෙහිව සත්‍ය වගකීම රු.35,265,606 ක් 2014 වසරේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. 2022 වර්ෂයේදී වර්වුවල් ඉන්වෙස්ට්මන්ට් සමාගම විසින් සීමිත නැට් වෙල්ත් සෙකියුරිටීස් සමාගම වෙත ගෙවිය යුතු මුළු REPO වගකීම වන රු. 325,000,000 වාරික 03 කින් ගෙවා පියවන ලෙස දන්වා තිබුණි. | එකඟ වේ. | -එම- |
| (ඇ) | ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු ලෙස සමාගමේ හිමිකාරිත්වය ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්ම සම්පූර්ණ කිරීමේ කොන්දේසි සහිතව මාස හයක කාලයක් සඳහා සමාගමේ ව්‍යාපාර සහ ක්‍රියාකාරකම් අත්හිටුවීම අවලංගු කිරීම, ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්ම අවසන් වන තුරු මාසිකව මහ බැංකුවට වාර්තා කිරීම, ප්‍රතිව්‍යුහගත කිරීම අවසන් වන තුරු අධ්‍යක්ෂ මණ්ඩලයට ඉල්ලා අස්වීම සීමා කිරීම, සමාගම අදාළ සියලු නීති, රෙගුලාසි සහ මාර්ගෝපදේශවලට සැමවිටම අනුකූල වීම, රජයේ සුරැකුම්පත්වල ප්‍රාථමික හා ද්විතියික වෙළෙඳපොළ ගනුදෙනුවලට ඵලදායී ලෙස සහභාගී වීම සහ ස්ථානීය පරීක්ෂණවලදී මතු කරන ලද ගැටළු අධීක්ෂණය කර නිවැරදි කිරීම යනාදිය ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. කෙසේ වුවද, සමාගම මෙම කොන්දේසිවලට අනුකූල වීමට අපොහොසත් වූ අතර ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු ලෙස සමාගම ව්‍යාපාරික කටයුතු සිදුකිරීම අත්හිටුවන ලදී. | එකඟ වේ. | අදාළ බලධාරීන් විසින් නියම කර ඇති කොන්දේසි වලට සමාගම අනුකූල විය යුතුය. |